# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,432—1939ක්වූ පෙබරවාරි මස 17 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

#### ඉඩම් විකිණීම සඳහා දැන්වීම.

ත්‍රිකුණාමලේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම්වල අවුරුදු 60 බද්ද ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1939ක්වූ අප්‍රේල් මස 4වෙනි අඟහරුවාදා උදේ 11ට ත්‍රිකුණාමලේ කච්චේරියේදී වෙන්දේසිකරණු ලැබේ.

බදුදීමේ කොන්දේසි ත්‍රිකුණාමලේ ආණ්ඩුවේ උප ඒජන්තතුමාගෙන්ද, ඉඩම් සිතියම් සර්වේයර් ජනරාල්තුමාගෙන්ද ඉල්ලා ලබාගත හැක.

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කට්ටුකුලම්පත්තුවේ කුච්චවෙල්ලිය නම් ගමේ පිහිටි බිම්කැබලි 3කි.

මුල් සිතියම් නො. A 367.

| නො. | ඉඩමේ නම. | අන්දම. | ඉල්ලුම්කාරයා. | මහත, අ. රූ. ප. | අක්කරයක තක්සේරු මිලේ හැටියට මුල් මුදල, රු. ශ. | පළමුවෙනි 15 අවුරුද්දට වාර්ෂික බදු මුදල, රු. ශ. |
|---|---|---|---|---|---|---|
| 1 | කප්පල්කර්නිතාවු | කැලෑව, කොටසක් එළිකරතිබේ | — | 0 0 18* | — | — |
| 2 | එම | කැලෑව | තුරෙශ්ගොඩ පදිංචි ආචාරී චාර්ල්ස් හෙන්රි සීගල් ජකාර්ඩ්වල් | 2 2 12 | 30 84 | 5 4 |
| 3 | එම | මූකලාන | — | 0 2 38† | — | — |

* මහපාරදිගට උතුරුකරහලද බිම (උතුරු කිරීමටයි). † මුහුද අසිගට උතුරුකරහලද බිම (උතුර කිරීමටයි).

ඉඩම වාසස්ථාන සෑදීම පිණිස සුදුසුයි. විශේෂයෙන්ම නිවාඩු කාලය ගතකිරීමට සුදුසුයි.

වර්ෂ 1939ක්වූ පෙබරවාරි මස 14වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කාර්‍ය්‍යයකට, ඒනම්:—ආණ්ඩුවේ සිංහල ගැහැනු පාඨශාලාවක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හතවෙනි කාණ්ඩයේ කාරනිබෙන පංකාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩුකාරක මන්ත්‍රී සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලයපිට නිසිආකාර මට අනුවැබී තිබේ, ඒ ඉඩම් නම්:—

උප්පැනගන්නාලද 3 කොටස. මුල් සිතියමේ නො. 976. ගම—වයඹ පලාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොලහත්පත්තුවේ යටිකහ දකුණුකෝරලේ අස්වැද්දුම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 41 | පරගහකොටුව නොහොත් දුම්පාලවත්ත | වත්ත | අස්වැද්දුම පදිංචි ඒ. එම්. ඇම්. කුමාරිහාමි, ඒ. එම්. ඇම්. ඩිංගිරිඅම්මා | 0 2 10·7 |
| 42 | මුරාතනගකුඹුරේ පිල්ලෑව | එම | දන්ඩගොමුවේ ඇම්. ආර්. ඩී. සිල්වා මහතා | 0 0 1·5 |
| 43 | එම | එම | එම | 0 0 0·6 |
| 44 | එම | එම | එම | 0 0 1·2 |

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 45 | ඩුම්ගොල්වත්ත | .. වත්ත | .. දන්ඩගොමුවේ එම්. ඒ. ඇම්. අබ්දුල් හමීඩ් | .. 0 1 16·7 |
| 46 | දන්ගස්පිටිය | .. එම | .. අත්වැද්දුමේ පදිංචි ඒ. එච්. ඇම්. කුමාරිහාමි, ඒ. එච්. ඇම්. හීංකිරිඅම්මා සහ ලීලී වික්‍රමසේකර | 0 0 23·6 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වශ 1939ක්වූ අප්‍රේල් මස 20වෙනි දින පෙරවරු 10යේ කාලයට කුලියාපිටියේ කානාගයේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1939ක්වූ පෙබරවාරි මස 14වෙනි දින කුරුණෑගල කච්චේරියේදීය.

ආර්. ඇස්. බී. පෙරේරා,
වයඹ පලාතේ ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—පොහොරබාවේ පාඨශාලාවක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරන පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හතරවෙනි කාණ්ඩයේ කරතිබෙන පංකාර්තුවල ප්‍රකාරයට උතුමාණන් වහන්සේගෙන් නියමඅනුසාර ඔට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

පිඹුරේ නො. A 315. ගම—ඉහළ පොහොරබාව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 210 | කනත්තවත්ත | .. මුඩුබිම | .. ජේ. ඇම්. ජයවර්ධන අප්පුහාමි | .. 0 0 8·2 |
| 211 | එම | .. වත්ත | .. ඒ. බී. ආරච්චි අප්පුහාමි | .. 0 0 34·2 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අයට ලියමනක්දී වර්ෂ 1939ක්වූ මාර්තු මස 28වෙනි දින උදේ 10යේ කාලයට රත්නපුරේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1939ක්වූ පෙබරවාරි මස 13වෙනි දින රත්නපුරේ කච්චේරියේදීය.

ආර්. ඇම්. රබීනිස්,
සබරගමු පලාතේ ආණ්ඩුවේ මහා ඒජන්ත වරයා.

---

## ඉඩම් සශ්‍රීකකිරීමේ දැන්වීම.

අවසරපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරීම පිළිබඳ ඉඩම් කච්චේරියේ දැන්වීමයි.

(මධ්‍යම පන්තියේ ලාභිකයන් සම්බන්ධයෙනි.)

මෙහි පහත විස්තර දැක්වෙන ඉඩම් සඳහාවූ ඉල්ලුම්පත්‍ර සලකාබැලීමට ගනු පිණිසත් කොටස් වශයෙන් ඒ ඉඩම්වලට අවසරපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරාගැනීම පිණිසත් හෙට්ටිපොල කානාගයේදී 1939ක්වූ අප්‍රේල් මස 25වෙනි දින පූ. භා. 10ට 1935යේ අංක 19 දරන ඉඩම් සශ්‍රීකකිරීමේ ආඥාපණත යටතේ ඉඩම් කච්චේරියක් වයඹ පලාතේ ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් පවත්වන බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. මේ ඉඩම්කට්ටි මධ්‍යම පන්තියේ ලාභිකයන්ට පමණකි.

3. සියලුම ඉල්ලුම්පත්‍ර ආණ්ඩුවේ ඒජන්තතුමා වෙත කුරුණෑගල කච්චේරියට 1939ක්වූ මාර්තු මස 20වෙනි දින හෝ ඊට මත්තෙන් ලැබිය යුතුයි.

4. ඉල්ලුම්කරුවන් විසින් ඉල්ලුම්කර තිබෙන ප්‍රමාණයේ හැටියට අක්කරයට රු. 3ක බැගින් වැටෙහෙන මුදලක් සියලුම ඉල්ලුම්පත්‍රත් සමඟ එවිය යුතුයි. ඉල්ලුම්කරුගේ ක්‍රියාවක් හෝ ප්‍රමාදයක් නිසා වූවමනා නැති අමතර මැනීමක් කිරීමට ආණ්ඩුවට සිදුවූවහොත් මේ මුදල ආපසු දෙනු නොලැබේ. එබඳු ඒ මුදලක් ඒ ඒ විශේෂ අවස්ථාවලදී ආපසු දීම හෝ නොදීම යුක්තිසහගතද්දැයි යන්න ගැන ඉඩම් කොමසාරිස්තුමන් විසින් කරන තීරණය අවසාන තීරණය වන්නේය.

5. සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙනීසිටීමට නියෝජිතයකු එවිය යුතුයි. ඉල්ලුම්කරු, නියෝජිත යන දෙදෙනාගෙන් එක්කෙනකුවත් ඉඩම් කච්චේරියට නොපැමිණියොත් ඉල්ලුම්කරු තම ඉල්ලීම සම්බන්ධයෙන් තවදුරටත් ක්‍රියාකිරීමට අකැමති බැව් ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් සලකනු ලැබේ.

6. මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගතයුතු යමක් ඇතහොත් එය ආණ්ඩුවේ ඒජන්තතුමාගෙන් විභාගකළ යුතුයි.

7. මෙහි පහත සඳහන් ඉඩම්වල පිඹුරු හෝ එහි කොපි, සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන් ඊට ගෙවියයුතු මුදල් ගෙවා ලබාගත හැකිවේ.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් කොමසාරිස්තුමා.

වර්ෂ 1939ක්වූ පෙබරවාරි මස 11වෙනි දින කොළඹ ඉඩම් කොමසාරිස්තුමාගේ කන්තෝරුවේදීය.

### දිමට සහ ඉඩම්වල විස්තර.

F. V. P. 1,575. ගම—දෙවමැදිහත්පත්තුවේ බලගඳුරකෝරළේ ගන්ශමුව යන ගම.

| කැබැල්ල. | ප්‍රමාණය (කිට්ටු වශයෙන්), අ. රූ. ප. | මේ ඉඩම්වල වැවීමට සුදුසු ශාක වගී. |
|---|---|---|
| 74 | .. 54 1 33 | පොල් හෝ වියලි ප්‍රදේශයේ අවුරුදු පතා හෝ ස්ථිර ලෙස වැවෙන වෙනත් ශාකවගී |
| 3 (කොටසක්) | .. 16 2 18 | |
| 11 | .. 0 2 2 | |
| 20 | .. 20 0 14 | |
| 21 (කොටසක්) | .. 61 2 8 | |
| 66 | .. 1 0 8 | |
| 67 | .. 25 1 28 | |
| 68 | .. 1 1 4 | |
| | 180 3 35 | |

---

## මැන්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

මාතර මොරවක්කෝරළේ ආණ්ඩුවේ දෙනිවල බද්ද විකිණීම.

මාතර මොරවක්කෝරළේ පිහිටි මෙහි පහත සඳහන් ලේඛනයේ විස්තර ඇති දෙනිවල බද්ද මොරවක්කෝරළේ මුදලිතුමා විසින් වර්ෂ 1939ක්වූ මාර්තු මස 6වෙනි සඳුදා පෙරවරු 9ට මොරවක්කෝරළේ මුදලිතුමාගේ කන්තෝරුවේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනුලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. බද්ද කාලය වර්ෂ 1939ක්වූ මාර්තු මස 1වෙනි දින පටන් අවුරුද්දක් වේ.

3. එක එක දෙනියේ බද්ද විකුණන තක්සේරු මිල විකුණුම් දිනයේදී දැනුම්දෙනු ලැබේ. වැඩි මුදලට ඉල්ලූ අය බද්දකාරයා හැටියට තෝරාගත් විගසම ඔහු ඉල්ලාහලද සම්පූර්ණ ගනන එදිනම ගෙවන්ට ඕනෑය. තවද ඔහු විසින් වර්ෂ 1939 මාර්තු මස 1වෙනි දින සිට අවුරුද්දක බද්දට අවසරපත්‍රය වශයෙන් G. A.—C 144 දරණ පෝරම කොලයක අත්සන් තැබිය යුතුයි.

4. විකිණීම්වල සම්පූර්ණ කොන්දේසි විකිණීම් දිනයේදී කියාදෙනු ලැබේ.

ඇම්. රාජේන්ද්‍ර,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වරයා.

වර්ෂ 1939ක්වූ පෙබරවාරි මස 9වෙනි දින මාතර කච්චේරියේදීය.

### ඉහත සඳහන් ලේඛනය.

(1) මරුට්ටුමේ පිහිටි නො. 44 දරණ අවසාන ගම් පිඹුරේ ලොට් නො. $127_B$ දරණ අ. 2, රූ. 2, ප. 11ක්වූ බටගෙඩ පැලදෙනිය නමැති දෙනියේ බද්ද.

(2) රුවුම්බේ පිහිටි නො. 44 දරණ අවසාන ගම් සිතියමේ ලොට් නො. 127ගේ බ්ලොක් නො. 1 දරණ අ. 1, රූ. 0, ප. 25ක්වූ ඉහල බටගොඩපෑලදෙනිය නමැති දෙනියේ බද්ද.

(3) පස්ගොඩ පිහිටි නො. 21 දරණ අවසාන ගම් සිතියමේ ලොට් නො. 109යේ බ්ලොක් නො. 1 දරණ අක්කරයක් පමණවූ මිහවිල නොහොත් බැම්මාවදෙනිය නමැති දෙනියේ බද්ද.

(4) සියඹලාගොඩ පිහිටි නො. 12 දරණ අවසාන ගම් සිතියමේ ලොට් නො. 206ගේ බ්ලොක් නො. 4 දරණ අ. 2, රූ. 0, ප. 30ක්වූ කල්ගස්පිටියදෙනිය නමැති දෙනියේ බද්ද.

(5) සියඹලාගොඩ පිහිටි නො. 12 දරණ අවසාන ගම් සිතියමේ ලොට් නො. 206ගේ බ්ලොක් නො. 5 දරණ අ. 6, රූ. 0, ප. 15ක්වූ කල්ගස්පිටියදෙනිය නමැති දෙනිය.

(6) සියඹලාගොඩ පිහිටි නො. 12 දරණ අවසාන ගම් සිතියමේ ලොට් නො. 206ගේ බ්ලොක් නො. 5 දරණ අ. 3, රූ. 1, ප. 20ක්වූ කල්ගස්පිටියදෙනිය නමැති දෙනියේ බද්ද.

(7) පනාකඩුවේ පිහිටි නො. 17 දරණ අවසාන ගම් සිතියමේ ලොට් නො. 1ගේ බ්ලොක් 'P' දරණ කොටසෙහි බ්ලොක් නො. 1 දරණ රූ. 2ක් පමණවූ බටපත්දෙල්හේන නමැති දෙනියේ බද්ද.

(8) පනාකඩුවේ පිහිටි නො. 17 දරණ අවසාන ගම් සිතියමේ ලොට් නො. 1ගේ බ්ලොක් 'P' දරණ කොටසෙහි බ්ලොක් නො. 2 දරණ රූ. 2ක් පමණවූ බටපත්දෙල්හේන නමැති දෙනියේ බද්ද.

---

## සුප්‍රීම් උසාවියේ දැන්වීම.

ශ්‍රී ලංකාවිපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබී තිබෙන ආඥාවක බලය කාරණකොටගෙන මෙයින් ප්‍රකාශකරන්නේනම් මධ්‍ය දිසාවේ ක්‍රිමිනල් නඩු විභාගය වර්ෂ 1939ක්වූ මාර්තු මස 10වෙනි දින පෙරවරු 11 පැය පටන් මහනුවර මඟුල්මඩුව තුල තිබෙන නඩුසාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණ ඇතුව සිටින සැමදෙනාම යටකී ස්ථානයට යටකී වේලාවට ඇවිත් පෙණීහිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුසුදුසුවන් බවත් මෙයින් සැම දෙනාටම දන්වන්නෙමි.

ඩබ්ලිව්. ඇල්. ඔර්ෆි,
මධ්‍ය දිසාවේ පිස්කල් වම්හ.

වර්ෂ 1939ක්වූ පෙබරවාරි මස 10වෙනි දින
මහනුවර පිස්කල් කන්තෝරුවේදීය.

ශ්‍රී ලංකාවිපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබී තිබෙන ආඥාවක බලය කාරණකොටගෙණ මෙයින් ප්‍රකාශකරන්නේනම් උතුරු මධ්‍යම දිසාවේ ක්‍රිමිනල් නඩු විභාගය වර්ෂ 1939ක්වූ මාර්තු මස 10වෙනි දින පෙරවරු 11 පැය පටන් මහනුවර මඟුල්මඩුවේ තිබෙන නඩුසාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණ ඇතුව සිටින සැමදෙනාම යටකී ස්ථානයට යටකී වේලාවට ඇවිත් පෙණීහිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුසුදුසුවන් බවත් මෙයින් සැමදෙනාටම දන්වන්නෙමි.

ජේ. බී. කරල්ලියද්දේ,
උ. ම. දි. උප පිස්කල්තුමා වම්හ.

වර්ෂ 1939ක්වූ පෙබරවාරි මස 10වෙනි දින
අනුරධපුර පිස්කල් කන්තෝරුවේදීය.

---

ශ්‍රී ලංකාවිපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබීතිබෙන ආඥාවක බලය කාරණකොටගෙන මෙයින් ප්‍රකාශකරන්නේනම් සැගල්ල දිසාවේ ක්‍රිමිනල් නඩු විභාගය වර්ෂ 1939ක්වූ මාර්තු මස 10වෙනි දින පෙරවරු 11 පැය පටන් මහනුවර තිබෙන නඩුසාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණ ඇතුව සිටින සැමදෙනාම යටකී ස්ථානයට යටකී වේලාවට ඇවිත් පෙණීහිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුසුදුසුවන් බවත් මෙයින් සැමදෙනාටම දන්වන්නෙමි.

ආර්. ඇම්. ඩේවිස්,
ස. දි. පිස්කල් වම්හ.

වර්ෂ 1939ක්වූ පෙබරවාරි මස 10වෙනි දින
රත්නපුරේ පිස්කල් කන්තෝරුවේදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.